# සෙලාන් බැංකුවේ 21 වන සැමරුම සමඟ අලුත් අවුරුදු තිළිණ

මෙවර සිංහල හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් සිය ගනුදෙනුකාර භවතුන්හට අගනා තිළිණ රැසක් හිමිකර දෙන සෙලාන් අලුත් අවුරුදු තැගි වරම් නමින් විශේෂ ප්‍රවර්ධන වැඩසටහනක් සෙලාන් බැංකුව දියත්කර ඇත.

අලුත් අවුරුද්දේ ගනුදෙනු සඳහා සෙලාන් බැංකු ශාඛා අප්‍රේල් මස 14 වෙනිදා උදෑසන 7.00 සිට සවස 1.00 දක්වා විවෘතව ඇති අතර එදිනට ආරම්භ වන මෙම ප්‍රවර්ධන වැඩසටහන අප්‍රේල් මස 30 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

සිංහල හින්දු අලුත් අවුරුද්ද මෙන්ම සෙලාන් බැංකුවේ 21 වන සංවත්සරය නිමිති කොට ගෙන ක්‍රියාත්මක වන මෙම ප්‍රවර්ධන කාලය අතරතුර, ඔබ මිලදී ගන්නා මාස 6 යේ ඉතුරුම් සහතික පත් සඳහා පැවැත්වෙන විශේෂ දිනුම් ඇදීමකින් වාසනාවන්තයින් 21 දෙනෙකු තෝරා ගනු ලබයි. සෑම රු. 1000/- කටම එක් දනුම් අවස්ථාවක් හිමිවන බැවින් වැඩිපුර ඉතුරුම් සහතිකපත් මිලදී ගෙන දිනුම් අවස්ථා වැඩි කර ගැනිමට ඔබට හැකියාව තිබේ. එමෙන්ම මෙම ඉතුරුම් සහාතිකපත් සඳහා 12% ක ආකර්ශණිය පොලී අනුපාතයක්ද හිමිවේ.

සෙලාන් බැංකුවේ 21 වන සංවත්සරය වෙනුවෙන් වාසනාවන්තයින් 21 දෙනෙකු තෝරන අතර පළමු වාසනාවන්තයාට රන් පවුන් 21 ක් හිමිවේ. අනෙක් වාසනාවන්තයින් 20 දෙනාට රු. 50,000/- බැගින් වන මාස 6 ඉතුරුම් සහතික පත් දිනා ගැනිමට අවස්ථාව උදාවේ.

මිට අමතරව රු. 20,000/-ක් හෝ ඊට වැඩි ඉතුරුම් සහතිකපත් මිලදී ගන්නා ගනුදෙනුකරුවන්ට අගනා ගමන් බෑගයක් හිමිවන අතර මෙම දිමනාව තොග අවසන් වනතුරු පමණක් ලබා දෙනු ඇත.

නව සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩලයක මඟ පෙන්වීමෙන් සවිමත් වී සිටින සෙලාන් බැංකුව, නිරන්තරයෙන්ම බැංකුකරණයේ අලුත් අත්දැකීම් තම ගණුදෙණුකරුවන්ට ලබාදෙමින් ඉතා ඉහල මට්ටමේ සේවාවක් ලබා දීමට කටයුතු කරනු ඇත.

දේශිය හා විදේශිය වශයෙන් ශ්‍රී ලංකිකයින්ට ඉහල සේවාවක් සපයමින් පෙරටත් වඩා සවිමත් බැංකුවක් ලෙස ඉදිරියේදි කටයුතු කිරිම සෙලාන් බැංකුවේ අරමුණයි.